# ගොවි කටයුතු පුවත් හසුන

වෙළුම 39
අංක 1
2016

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය


## ගොවිජන ක්ෂේත්‍රය හා සම්බන්ධ පර්යේෂණ අධ්‍යයනයන් පිළිබඳ හයවැනි වාර්ෂික සමුළුව




හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික පර්යේෂණ සමුළුව මාර්තු මස 18 දින කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙවර එය පැවැත්වුණේ හයවෙනි වරටයි.

පසුගිය දෙවසර තුළ ආයතනයේ පර්යේෂකයින් විසින් සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනයන්හි සොයා ගැනීම් මෙහිදී ඉදිරිපත් කෙරුණු අතර පර්යේෂකයින්ට තම සොයා ගැනීම්, නව දැනුම හා අත්දැකීම් මෙරට කෘෂිකාර්මික සහ ගොවි කටයුතුවල නිරත වන්නන්, සම්පත් භාවිතා කරන්නන් සහ අනෙකුත් පාර්ශවකරුවන් අතර හුවමාරු කර ගැනීමට මෙය මහඟු අවස්ථාවක් විය.

ශ්‍රී ලංකාවේ ගොවිජන ක්ෂේත්‍රයෙහි නියුතු නවක පර්යේෂකයින් දිරිමත් කිරීමේ HARTI ආයතනයේ දීර්ඝ කාලීන සම්ප්‍රදාය තවදුරටත් තහවුරු කරමින් මෙවර මෙම සමුළුව තුළ පර්යේෂණ සොයා ගැනීම් එළි දැක්වීමට පසුගිය දෙවසර තුළ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි ගොවිජන ක්ෂේත්‍රයට සම්බන්ධ පර්යේෂණ නිබන්ධන සිදුකළ විද්‍යාර්ථයින්ට ද අවස්ථාව ලබා දී තිබීම විශේෂත්වයකි.

කෘෂි ආර්ථික විද්‍යාව, ගොවිපළ කළමනාකරණය, කෘෂි ව්‍යාප්තිය, කෘෂිකාර්මික අලෙවිකරණය, කෘෂිකාර්මික ප්‍රතිපත්ති විශ්ලේෂණය, ග්‍රාමීය සංවර්ධනය, ගොවිජන ක්ෂේත්‍රය ආශ්‍රිත ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා තාරුණ්‍යය පිළිබඳ අධ්‍යයනයන්, කෘෂිකාර්මික හා පාරිසරික සම්පත් කළමනාකරණය , ගොවිජන කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘති ඇගයීම, ආහාර හා පෝෂණය පිළිබඳ අධ්‍යයනයන්, ආහාර සුරක්ෂිතතාවය හා ආහාර ප්‍රතිපත්ති සහ දේශගුණික විපර්යාසයන්ගෙන් කෘෂිකර්මයට සිදුවන බලපෑම ආදී පර්යේෂණ තේමාවන්වලට වැඩි ඉඩක් වෙන් වී තිබුණි.

පර්යේෂණ සමුළුව සඳහා ඉදිරිපත් කිරීම් කරනු ලබන පර්යේෂකයින් තව දුරටත් දිරිමත් කිරීමේ අරමුණු ඇතිව වාචික ඉදිරිපත් කිරීම හා පෝස්ටර් ඉදිරිපත් කිරීම යටතේ අදාළ 'හොඳම ඉදිරිපත් කිරීම' වෙනුවෙන් මුදල් ත්‍යාග ලබා දීමට කටයුතු යොදා තිබුණි. එහිදී ආයතනයේ පර්යේෂණ නිලධාරීන්ගේ පෝස්ටර් ඉදිරිපත් කිරීම් අතුරින් හොඳම පෝස්ටර් ඉදිරිපත් කිරීම සඳහා වූ මුදල් ත්‍යාගය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එච්.එම්.ජේ.කේ හේරත් මහතා විසින් දිනාගත් අතර හොඳම වාචික ඉදිරිපත් කිරීම සඳහා වූ ත්‍යාගය ජයග්‍රහණය කළේ පර්යේෂණ නිලධාරී අයි.පී.පී.එම් විජේසිංහ මහතා විසිනි. බාහිර පර්යේෂකයින් විසින් ඉදිරිපත් කළ පෝස්ටර් ඉදිරිපත් කිරීම් අතුරින් හොඳම පෝස්ටර් ඉදිරිපත් කිරීම සඳහා වන ත්‍යාගය ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පී.ඩබ් ජීවන්ති මහත්මිය විසින් හිමි කර ගත්තාය.

# සම්පූර්ණ කළ අධ්‍යයන

## බස්නාහිර පළාතේ කුඹුරු ඉඩම් ගොඩ කිරීමට හේතු සහ එහි බලපෑම්

**විෂයපථය සහ අරමුණු**

ආහාර නිෂ්පාදනය, ජාතික ආහාර සුරක්ෂිතතාවය සහ පාරිසරික තිරසාරභාවය සැලකිල්ලට ගනිමින් රජය විසින් කුඹුරු ඉඩම් ආරක්ෂා කිරීම සඳහා නීති රෙගුලාසි රැසක් ක්‍රියාත්මක කර තිබේ. මෙම නීති රෙගුලාසි තිබිය දී වුව ද වසර ගණනාවක පටන් කුඹුරු ඉඩම් ගොඩ කිරීමේ ප්‍රමාණය වැඩිවෙමින් පවතී. අවසර ඇතිව හෝ නැතිව කුඹුරු ඉඩම් ගොඩ කිරීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් බලපෑමට ලක්ව තිබෙන්නේ බස්නාහිර පළාතයි. ආහාර නිෂ්පාදනයට, පරිසරයට මෙන් ම ජාතික ආර්ථිකයට අදාළ ගැටලු රැසක් නිර්මාණය කර ඇති හෙයින් මෙම අධ්‍යයනය මඟින් විමර්ශනය කිරීමට උත්සහ ගනුයේ කුඹුරු ඉඩම් ගොඩ කිරීමට ජනතාව නැඹුරු වී ඇත්තේ ඇයිද යන්න සහ කුඹුරු ඉඩම් ගොඩ කිරීමෙන් ආර්ථිකයට හා සමාජයට ඇති බලපෑම් මොනවාද යන්න අධ්‍යයනය කිරීමයි.

**සොයා ගැනීම්**

i. බස්නාහිර පළාතේ කුඹුරු ඉඩම් හිමිකරුවන් මුහුණ දෙන ගැටලු අතර වාරිමාර්ග ගැටලු (39%), කම්කරු ශ්‍රම හිඟය (29%), පසේ ආම්ලිකතාවය ඇතුළු පාංශු තත්ත්වයන් පිළිබඳ ගැටලු (25%) සහ ඉහළ නිෂ්පාදන පිරිවැය (21%) ආදිය ප්‍රධාන වේ. මේ හේතුවෙන් ගොවීන් බහුතරයක් (70%) තම කුඹුරු ඉඩම් වගා නොකර අත්හැර තිබේ.

ii. ඉඩම් ගොඩ කිරීමට අදාළ සිද්ධීන් බොහොමයකගෙන් කොටසක් (70.3%) වගා නොකර අත් හරින ලද ඉඩම් වන අතර 18.3ක ප්‍රතිශතයක් සංරක්ෂිත/ඕවිට/දෙනි වශයෙන් පැවතීම දැකිය හැකිය.

iii. සමහර පුද්ගලයින් දින 2-3 අතර කාලයකින් කුඹුරු ඉඩම ගොඩ කර තිබුණි. විශේෂයෙන්ම ඔවුන් නිසි බලධාරීන්ගෙන් වසන් කිරීම පිණිස එවැනි ඉඩම් ගොඩ කර තිබුණේ සති අන්තයේ දිනවල හෝ පොහොය නිවාඩු දිනයන්හිය. බොහෝ අවස්ථාවල ගොඩ කරන ලද කුඹුරු ඉඩම්වලට මායිම් ව පුරන් වූ වෙනත් කුඹුරු ඉඩමක් (51.4), ගොඩ ඉඩමක් (48%), වාරි ඇළක් (41.7%) හෝ ප්‍රධාන මාර්ගයක් (41.1%) පිහිටා තිබිණි.

iv. කුඹුරු ඉඩම් ගොඩ කිරීමට සම්බන්ධ සිද්ධීන් බහුතරය (84%) නීති විරෝධී ලෙස සිදු කර තිබේ. එසේ නීති විරෝධී ලෙස සිදුකළ අයගෙන් 77.7%ක් ම ඒ සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් අනුමැතිය ලබා ගැනීමට අයදුම් කිරීමක් හෝ සිදුකර නොතිබූ අතර ඉතිරි පිරිස (22.3%) ගොවිජන සේවා මධ්‍යස්ථානවල අනුමැතිය ඉල්ලා අහිමි වූ පසු කුඹුරු ඉඩම් ගොඩ කිරීම සිදු කර තිබුණි.

v. කුඹුරු ඉඩම් ගොඩ කිරීමට එරෙහිව ක්‍රියා මාර්ග ගැනීමේ දී ගොවිජන සේවා මධ්‍යස්ථාන නිලධාරීන්ට මුහුණ දීමට සිදු වූ ගැටලු අතර ගොවි සංවිධානවලින් එල්ලවන විරෝධතා (46%), තුන්වන පාර්ශවයකින් සිදු කරන අනවශ්‍ය බලපෑම් (44%), ඉඩම් හිමිකම් ගැටලු (36%), පහර දීම් හා විවේචන ආදිය ප්‍රධාන වේ.

**නිර්දේශ**

i. ප්‍රායෝගික හේතු මත වගා කිරීම සිදු කළ නොහැකි කුඹුරු ඉඩම් සඳහා කුඹුරු ඉඩම් පනතට විකල්ප ප්‍රතිපාදන එක් කළ යුතුය. එවැනි ඉඩම් හඳුනාගෙන එම කුඹුරු ඉඩම්වල තත්ත්වය අනුව ලබා ගත හැකි විකල්ප ප්‍රයෝජන හඳුනා ගත යුතුය.
ii. නීති විරෝධී ලෙස කුඹුරු ඉඩම් ගොඩ කිරීම්වලට විරුද්ධව ක්‍රියාමාර්ග ගැනීමට යෑමේ දී ගොවිජන සේවා මධ්‍යස්ථානවල නිලධාරීන්ට මහත් දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදු වේ. එබැවින් අනවසර කුඹුරු ඉඩම් ගොඩ කිරීම සම්බන්ධව සොයා බැලීම සඳහා හදිසි වැටලීම් අංශයක් ස්ථාපිත කිරීම වැදගත් ය.

**පර්යේෂණ කණ්ඩායම** එච්.එම්.ජේ.කේ. හේරත් මහතා සම්බන්ධීකරණ නිලධාරී

## තල් කර්මාන්තකරුවන්ගේ සමාජ - ආර්ථික තත්ත්වය සහ ඔවුන්ගේ ගැටලු පිළිබඳ විශ්ලේෂණයක්

**විෂයපථය හා අරමුණු**

ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශවල ස්වභාවිකව වැඩෙන තල් ශාඛය විවිධ නිෂ්පාදන සිදු කිරීම සඳහා ආදායම් මාර්ගයක් ලෙස ඉහළ ශක්‍යතාවයක් සහිතය. උතුරේ පැවතුණ යුද ගැටුම් හේතුවෙන් බිඳ වැටුණු කර්මාන්ත හා ආදායම් මාර්ග නැවත නඟා සිටුවීමේ දී තල් කර්මාන්තයේ වර්තමාන තත්ත්වය අවබෝධ කර ගැනීම සහ එය සංවර්ධනය කිරීම සඳහා පවතින බාධා හඳුනාගැනීම වැදගත් වේ.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ තල් කර්මාන්තයේ වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීම සහ එය සංවර්ධනය කිරීම සඳහා පවතින බාධා අධ්‍යයනය කිරීමයි .

**සොයා ගැනීම්**

01. අධ්‍යයනයට යොදා ගත් දිස්ත්‍රික්කයන් හි බහුතරයක් (65%) රා මදින්නන්ගේ ප්‍රධාන ජීවිකාව වූයේ තල් රා මැදීමයි. ඉන් 75% තම ද්විතියික රැකියාව වශයෙන් කෘෂිකර්මාන්තයෙහි සහ පුහුණු ශ්‍රමයෙහි නිරතව සිටියහ.

02. තෝරා ගත් සෑම දිස්ත්‍රික්කයකම රා මදින්නන් 75%ක් තෙලිජ්ජවලින් රා සකස් කර සමූපකාර වලට විකුණන අතර සමූපකාර විසින් තෙලිජ්ජ සහ හකුරු වැනි වෙනත් නිෂ්පාදන සිදු කිරීම දකිනු ලැබිණි.

03. තල් සංවර්ධන සමූපකාර සමිතිවලට තල් මීරා අලෙවි නොකරන පුද්ගලයින්ගෙන් ඒවා මිල දී ගෙන පෞද්ගලිකව ගෘහ කර්මාන්තයක් ලෙස තල් පැණි සහ තල් හකුරු නිපදවා පෞද්ගලිකව අලෙවි කරයි. තල් හකුරු කිලෝවක් රුපියල් 550 සිට 600 දක්වා මිල පරාසයක අලෙවි කෙරේ.

04. තල් කොළ ආශ්‍රයෙන් ගෙදරදොර පාවිච්චිය සඳහා සහ විසිතුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයේ කාන්තාවන් අතර ගෘහස්ථ කර්මාන්තයක් ලෙස ජනප්‍රියව පවතී. මෙම කර්මාන්තයේ නියැළීමට අධ්‍යාපනය අවසන් කළ තරුණියෝ ද කැමැත්තක් දැක්වූහ. උපයා ගත හැකි මාසික ආදායම රු.6000-8000 දක්වා අතර පරාසයක පැවතිණි.

05. රා මදින්නන්නට එමඟින් ආකර්ෂණීය ආදායමක් උපයාගත හැකිය. බොහෝ විට දළ වශයෙන් රු.62,000 සිට රු.86,000 දක්වා වූ ආදායමක් මාසිකව ලබාගත හැකි නමුත් පැහැදිලිව පෙනෙන්නට පවතින දෙයක් නම් ඔවුන් තුළ ආදායම් ඉතිරි කිරීමේ නැඹුරුතාවක් නැති බවයි.

06. මෙම වෘත්තියට අදාළ අඩු සමාජ පිළිගැනීම නිසා 90%ක් රා මදින පවුල්වල අය එහි ආදායම පවා නොතකා තම දරුවන් මෙම වෘත්තියට යොමු වනු දැකීමට අකමැතිය.

**නිර්දේශ**

01. උතුරු ප්‍රදේශවල ජනතාව විසින් නීතිවිරෝධී ලෙස නිෂ්පාදනය කරන මත්පැන් තහනම් කර තල් රා අලෙවිය පුළුල් කිරීම හා සමගාමීව රට තුළට එතනෝල් ගෙන්වීම නැවැත්වීම.

02. තල් ගසට නැගීම සඳහා ගසින් ගසට ගෙන යා හැකි සරල ජංගම උපකරණයක් හඳුන්වා දීම සහ ඒ හරහා තරුණ පිරිස් රා ආශ්‍රිත නිෂ්පාදන සඳහා උනන්දු කරවීමට තෙලිජ්ජ ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීම සඳහා තාක්ෂණය හඳුන්වා දීම.

03. ආකල්ප සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන් හරහා රා මදින්නන්ට තම ආදායම ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා ඉතිරි කිරීමට දිරිමත් කිරීම.

පර්යේෂණ කණ්ඩායම : ආර්.එල්.එන්. ජයතිස්ස මහතා - සම්බන්ධීකරණ නිලධාරී
ශ්‍රී විජේන්ද්‍ර මහතා - සම පර්යේෂක

## 2012 වර්ෂය අග භාගයේ රජය විසින් ක්‍රියාත්මක කළ කඩිනම් ජලාශ හා වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ තක්සේරුවක්

2012 වර්ෂයේ යල කන්නය තුළ ඇති වූ උග්‍ර නියඟය හේතුවෙන් වියළි කලාපයේ කෘෂිකාර්මික කටයුතු බෙහෙවින් අඩාළ වූ අතර දළ වශයෙන් සිදු වූ අස්වනු පාඩුව ඊට පෙර එනම් 2011 වසර හා සැසඳීමේ දී 43%කි. මීට පිළියම් ලෙස ශ්‍රී ලංකා රජය විසින් නියං බලපෑම අවම කිරීමේ කඩිනම් වැඩපිළිවෙළ හා සහන වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබිණි. මෙම වැඩසටහනේ එක් සංරචකයක් ලෙස ක්‍රියාත්මක කළ කඩිනම් ජලාශ හා වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ මෙම අධ්‍යයනයෙන් ඇගයීමට ලක් කෙරිණි.

**විෂයපථය සහ අරමුණු**

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ රජය විසින් දියත් කළ කඩිනම් ජලාශ හා වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ ව්‍යාපෘතියෙන් ලද අත්දැකීම් සහ එහි බලපෑම ලේඛනගත කිරීම තුළින් මේ හා සමාන අනාගත ව්‍යාපෘතීන් සඳහා මග පෙන්වීමක් ලබා දීමයි.

**සොයා ගැනීම්**

01. ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම කෙටි කාල පරාසයක් තුළ සිදු කරන ලද නිසා ප්‍රජා දැනුවත්භාවය, සක්‍රීය ප්‍රජා දායකත්වය සහ වගකීම් බෙදාහදා ගැනීම වැනි ව්‍යාපෘති සඳහා අවශ්‍ය වැදගත් සංරචක සඳහා ගැටලු මතු වී තිබේ.

02. අදාළ කෙටි කාල පරාසය තුළ සමහරක් ජලාශවල රොන් මඩ ඉවත් කිරීමේ වැඩසටහන් අවසන් කරගත නොහැකි වී තිබුණි.

03. ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා ලබා තිබූ මාස 03 ක සීමිත කාල සීමාව තුළ තාක්ෂණික කාර්ය මණ්ඩලය සහ උපකරණ සොයා ගැනීමේ පහසුතාවයට අදාළ රේඛීය ආයතන මුහුණ දී තිබුණි.

04. කුඩා වාරි පද්ධති ආශ්‍රිතව වගාකළ හැකි බිම් ප්‍රමාණය ඉහළ දැමීම සඳහා ජලාශවල රොන් මඩ ඉවත් කිරීමෙන් සැලකිය යුතු බලපෑමක් එමඟින් වියළි කාලයන්හි සිදුවී නැති නමුත් ප්‍රදේශයේ ජනතාවගේ විවිධ ජීවනෝපායන්ට සහ එදිනෙදා ගෘහස්ත ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ප්‍රශංසනීය ප්‍රතිලාභයක් සිදු වී තිබේ.

05. බොහෝ කාලයක් අවධානයට ලක්ව නොතිබූ කුඩා වැව්වල රොන්මඩ ඉවත් කිරීමට යම්කිසි පියවරක් ගැනීම සම්බන්ධයෙන් ප්‍රතිලාභී ගොවීන් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රශංසාත්මක බවක් දැක්වූහ.

06. ඉදිරියේ දී මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාපෘතියේ විවිධ අංග අවශ්‍ය පරිදි වෙනස්කම් සිදු කිරීමේ හැකියාව තිබිය යුතු අතර ප්‍රතිලාභීන්ගේ දැනුම සහ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී උගත් පාඩම් ඇසුරින් ව්‍යාපෘතිය සඳහා සුදුසු වැව් හා ක්‍රමවේදය තෝරා ගැනීම කළ යුතු වේ.

**නිර්දේශ**

01. රොන්මඩ ඉවත් කිරීම සඳහා ජලාශ තෝරා ගැනීම ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන සිදු කළ යුතුය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාල පරිච්ඡේදය තුළ හැකිතාක් දුරට ප්‍රතිලාභීන්ගේ සක්‍රීය දායකත්වය ලබාගත යුතු ය.

02. ප්‍රතිලාභීන්ගේ දැනුම හා අදහස් ව්‍යාපෘතිය තුළට සුදුසු පරිදි ඇතුළත් කර ගැනීම සඳහා ඉඩ ප්‍රස්තා තිබිය යුතුය .

03. ව්‍යාපෘතියේ සාර්ථකත්වය ඉහළ දැමීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර එහි ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රතිලාභීන් මනා ලෙස දැනුවත් කිරීම කළ යුතු වේ .

04. ජල කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දීම සහ ජලයේ කාර්යක්ෂමතාව වැඩිවන්නා වූත් ලාභ උපරිම කර ගැනීමට ද හැකිවන පරිදි බෝග තෝරා ගැනීම පිළිබඳ ගොවීන් දැනුවත් කළ යුතු වේ.

05. ජලාශවල රොන්මඩ ඉවත් කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී වාරි ජල සම්පාදනයට පමණක් එහි ප්‍රතිලාභ සීමා නොකළ යුතු අතර මත්ස්‍ය කර්මාන්තය, සත්ත්ව පාලනය, ගෘහස්ත අවශ්‍යතා ආදී වෙනත් ක්ෂේත්‍රවලට ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වේ.

**පර්යේෂණ කණ්ඩායම :** එම්.ඒ.සී.එස් .බණ්ඩාර මහතා - සම්බන්ධීකරණ නිලධාරී

ජී.ජී.ද.එල්.ඩබ්. සමරසිංහ මිය - සම පර්යේෂිකා

## තක්කාලි සැකසුම්කරණයෙහි ආයෝජනය කිරීමෙන් උගත් පාඩම් හා අත්දැකීම් සිද්ධි අධ්‍යයනය, මාතලේ දිස්ත්‍රික්කය

අස්වනු නෙළන සමයේ තක්කාලිවලට ස්ථිර සහ සාධාරණ මිලක් නොමැතිකම ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාව මුහුණදෙන ප්‍රධාන ගැටලුවලින් එකකි. තක්කාලි අතිරික්ත නිෂ්පාදනයට පිළියමක් ලෙස දේශීය ආයෝජකයෙකු විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහය හා මග පෙන්වීම යටතේ තක්කාලි සැකසුම් කර්මාන්ත ශාලාවක් මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්දා කර්මාන්තපුරයෙහි ඉදි කරන ලද අතර පළමු අත්හදා බැලීමෙන් පසුව කර්මාන්තශාලාව වසා දමන ලදී. කර්මාන්තශාලාව වසා දැමීමට හේතු වූ කරුණු අධ්‍යයනය කිරීම තුළින් අනාගතයේ දී මෙවැනි ආයෝජනයන් සඳහා නිර්ණායකයන් ඉදිරිපත් කිරීම මෙම අධ්‍යනයේ අරමුණයි.

**සොයා ගැනීම්**

**කර්මාන්තශාලාවේ අසාර්ථකත්වයට බලපා තිබූ ප්‍රධාන කරුණු වූයේ,**

i. බොහොමයක් ගොවීන් විසින් වගා කරන ආනයනික දෙමුහුන් තක්කාලි වර්ගවල අන්තර්ගත බ්‍රික්ස් අගය සහ ලයිකොපීන් ප්‍රමාණයන් තක්කාලි සැකසීම සඳහා එතරම් සුදුසු නොවීම.

ii. කර්මාන්තශාලාව වෙත තක්කාලි රැගෙන ඒම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොතිබීම.

iii. යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා දිනකට අවශ්‍ය තක්කාලි ප්‍රමාණය කිලෝ 7000ක් වූ අතර ආයෝජන වියදම පියවා ගැනීම සඳහා කිලෝ 20,000ක ප්‍රමාණයක් දිනකට අවශ්‍ය විය. එහෙත් එම ප්‍රමාණය ලබා ගැනීම සඳහා ගොවීන් සමග සංවිධානගත වූ ජාලයක් නොතිබීම.

iv. කර්මාන්තශාලාව විසින් තක්කාලි කිලෝවක් සඳහා පිරිනැමිය හැකිව තිබූ ප්‍රශස්ත මිල රුපියල් 20-25 පරාසයක වූ අතර මිල දී ගන්නා සමය වන විට විවෘත වෙළඳපළෙහි තක්කාලි මිල කර්මාන්තශාලාව විසින් ලබා දුන් මිලට වඩා වැඩි වීම.

v. ආනයනය කරනු ලබන පල්පය සමග සැසැඳීමේ දී දේශීය නිෂ්පාදනය තත්ත්වයෙන් අඩු මෙන්ම මිලෙන් වැඩි විය හැකි බවට එහි විභව ගනුදෙනුකරුවන්ගේ මතය වූ බැවින් නිෂ්පාදනය සඳහා පැවති ඉල්ලුම ද හිතකර නොවිණි.

**නිර්දේශ**

i. මෙවැනි මැදිහත්වීම් අනාගතය සඳහා සැලසුම් කිරීමේ දී අමුද්‍රව්‍යයන්හි තාක්ෂණික ශක්‍යතාවය, අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය පහසුවෙන් ලබා ගැනීමට ඇති හැකියාව, අවශ්‍ය කාලයේ දී ප්‍රශස්ත මිලකට ලබා ගැනීමේ හැකියාව ආදිය සැලකිල්ලට ගත යුතුවා මෙන්ම අවසන් නිෂ්පාදනය සඳහා පවතින ඉල්ලුම ද මිල සහ ප්‍රමිතිය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සැලකිල්ලට ගත යුතුය.

පර්යේෂක කණ්ඩායම - ඉන්දිකා එදිරිසිංහ මෙනවිය - සම්බන්ධීකරණ නිළධාරිණී

## සිදු කෙරෙමින් පවතින අධ්‍යයන

**පහතරට තෙත් කලාපයේ කුඹුරු බිම් වී වගාව සඳහා ශක්‍යතාවය අනුව වර්ගීකරණය කිරීම**

ශ්‍රී ලංකාවේ පහත රට තෙත් කලාපයේ කුඹුරු විවිධ හේතු නිසා පුරන් වීම සහ වෙනත් පරිහරණයන්ට යොදා ගැනීම සුලභව දක්නට ලැබේ. මේ සඳහා සමාජ - ආර්ථික හේතු මෙන්ම භූමියේ ඇති සීමාකාරී සාධක ද බලපා ඇත. ජලවහනය සම්බන්ධ ගැටලු, ගං වතුර, විෂ තත්ත්වයන්, ලවනතාවය, හැල් බව ආදිය භෞතික වශයෙන් ද අස්වැන්න අඩුකම, ශ්‍රමිකයින්ගේ හිගය, අයිතිය හා බුක්තිය සම්බන්ධ ගැටලු, යන්ත්‍රෝපකරණ භාවිතය සම්බන්ධ ගැටලු, නිෂ්පාදන පිරිවැය ඉහල යෑම ආදී ගැටලු සමාජ-ආර්ථික වශයෙන් ද දැක්විය හැක. සීමාකාරී සාධක සහ ඒවායේ මට්ටම් විවිධ නිසා කුඹුරුවලින් ලැබෙන අස්වැන්න ද විවිධ වේ. සීමාකාරී සාධක අනුව කුඹුරු සඳහා ශක්‍යතා වර්ගීකරණයක් නොමැති නිසා මෙවැනි වර්ගීකරණයකින් වී වගාවට වැඩි ශක්‍යතාවයක් ඇති කුඹුරු හඳුනා ගැනීමටත්, කුඹුරු පුරන්ව ඇත්නම් ඒ සඳහා බලපානුයේ සීමාකාරී සාධක ද නැතිනම් සමාජ-ආර්ථික සාධක ද යන්න පැහැදිලිව හඳුනාගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව පහත රට තෙත් කලාපයේ කුඹුරුවල ඇති සීමාකාරී සාධක පදනම් කර ගනිමින් ඒවා වර්ගීකරණය කිරීම තුළින් කුඹුරු ඉඩම් භාවිතය හා කළමනාකරණය වැඩි දියුණු කිරීමට දායක වන ප්‍රතිපත්ති සම්පාදනයට හා සංවර්ධන ක්‍රියාදාමයන්ට අවශ්‍ය මග පෙන්වීම ලබා දීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

විශේෂිත අරමුණු

1. කුඹුරු ඉඩම් පුරන්වීම කෙරෙහි බලපාන සීමාකාරී තාක්ෂණික සාධක හා සමාජ-ආර්ථික සාධක හඳුනා ගැනීම.
2. එම සීමාකාරී සාධක පදනම් කර ගෙන වඩා ලාභදායී හා කාර්යක්ෂමව කුඹුරු ඉඩම් වර්ගීකරණය කළ හැකි සරල ක්‍රමවේදයක් සකස් කිරීම.
3. එම ක්‍රමවේදය භාවිතා කර තෝරා ගත් යාය කිහිපයක කුඹුරු ඉඩම් වර්ගීකරණය කිරීම.

**පර්යේෂණ කණ්ඩායම -** ප්‍රසන්න විජේසිංහ - සම්බන්ධීකරණ නිලධාරී
එච්.ඩී. සිසිර හපුආරච්චි - සම පර්යේෂක

ගොවි කටයුතු පුවත් හසුන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මගින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රවෘත්ති ප්‍රකාශනයකි. ආයතනය සහ ගොවි කටයුතු ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් සංවිධාන මගින් සිදු කෙරෙන පර්යේෂණ හා ක්‍රියාකාරී වැඩසටහන් වලදී ලබා ගන්නා පර්යේෂණ තොරතුරු මෙ මගින් ප්‍රකාශයට පත් කෙරේ.

ලබාගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකිය

සකස් කළේ - වසන්ති රාජපක්ෂ

පරිගණක මෙහෙයුම් - ඒ.පී. උදේනි කරුණාරත්න

## පුහුණු කිරීම්

මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය විසින් 2015 වර්ෂයේ අවසාන කාර්තුවේ දිවයින පුරා පුහුණු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරනු ලැබිණි.

**01. නිරෝගී පරපුරක් සඳහා කෘෂිකර්මාන්තය පුහුණු වැඩසටහන**

උතුරු මැද පළාතේ වකුගඩු රෝගය ව්‍යාප්තව ඇති ප්‍රදේශයන්හි ගොවි ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය යහපත්ව පවත්වා ගැනීමටත් පරිසර සම්පත් ආරක්ෂා කර ගැනීමටත් උපදෙස් ලබා දීම අරමුණු කර ගනිමින් පවත්වනු ලබන මෙම පුහුණු වැඩසටහනට ගොවි ජනතාවගේ විශාල ප්‍රසාදයක් හිමි වී තිබේ. පසුගිය වසර අවසානය වන විට පුහුණු වැඩසටහන් 39ක් ක්‍රියාත්මක කර ඇති අතර පොලොන්නරුව හා අනුරාධපුර දිස්ත්‍රික්කයන් හි බකමූණ, හිඟුරක්ගොඩ, සේවාගම, සිරිපුර, මනම්පිටිය, වැලිකන්ද, නව නගරය, ගිරිතලේ, පුලස්තිගම, අඹගස්වැව, ගල් අමුණ,පදවිය, මැදිරිගිරිය ගොවි ජන සේවා බල ප්‍රදේශයන්හි පැවැත්වූ පුහුණු වැඩසටහන්වලින් ගොවීන් 935 දෙනෙකුට පුහුණුව ලබා දීමට හැකියාව ලැබී ඇත.

මෙම පුහුණු වැඩසටහන සඳහා සම්පත් දායකත්වය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන එස්.එම්.ඒ. සමරකෝන් සහ පී.සී.ජේ. ද සිල්වා මහත්වරුන් විසින් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පත්දායකයින්ගේ හා පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සම්පත් දායකයින්ගේ සහභාගීත්වයෙන් සිදු විණි.

**02. සමාජ සජීවීකරණය පිළිබඳ පුහුණු වැඩසටහන**

සමාජ සජීවිකාරකයින් ලෙස ගොවිකටයුතු හා ග්‍රාමීය සංවර්ධන ක්‍රියාකාරකම්හි නිරතව සිටින කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධන නිලධාරීන් සඳහා සංවිධානය කර ඇති මෙම පුහුණු වැඩසටහනෙහි අරමුණ එයට සහභාගීවන්නන්ගේ සමාජ සජීවීකරණය හා සහභාගීත්ව සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම වැඩි දියුණු කිරීමයි.

2015 වසරේ නොවැම්බර් මස 10 දින සිට 13 දින දක්වා පැවැති පුහුණු වැඩසටහනින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් 35 දෙනෙකු පුහුණු කෙරිණි. මේ සඳහා සම්පත් දායකත්වය එස්.එම්.ඒ. සමරකෝන්, පී.සී.ජේ. ද සිල්වා, එච්.එම්.ජේ.කේ. හේරත්, එච්.ජේ.සී.ජයසූරිය යන පර්යේෂණ නිලධාරීන් විසින් ලබා දෙන ලදී.

**03. කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන**

2015 නොවැම්බර් මස 23,24 යන දිනයන්හි ගන්නොරුව කෘෂිකර්ම විද්‍යාලයේ නිලධාරීන්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන්, පුත්තලම දිස්ත්‍රික් ක්‍රම සම්පාදන කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් ඇතුළු නිලධාරීන් 73 දෙනෙකුට පුහුණුව ලබා දෙන ලද අතර ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එච්.එම්.ජේ.කේ. හේරත් මහතා විසින් එය මෙහෙයවනු ලැබිණි.

ඊට අමතරව බාහිර ආයතන විසින් සංවිධානය කරනු ලදුව අප ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එච්.එම්.ජේ.කේ. හේරත් මහතා එවැනි බාහිර පුහුණු වැඩසටහන් කිහිපයකට සම්පත්දායකත්වය ලබා දී තිබේ.

ගොවි කටයුතු පුවත් හසුන මුද්‍රිත ද්‍රව්‍ය

හපුතන්ත්‍රි ධර්මසේන
අධ්‍යක්ෂ
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07